මගේ අංකය / எனது இல / My No: HA/1/7/4/16/2
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2020.02.05

ඉතා හදිසි

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

**බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය මඟින් අඩු ආදායම්ලාභීන් 100,000 ක් වෙත රැකියා ලබා දීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම**

උක්ත කරුණ සඳහා මේ වන විට ඔබ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඔබ දිස්ත්‍රික්කයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලැබී ඇති අයදුම්පත් වල සඳහන් තොරතුරු හැකි ඉක්මනින් http://app.mdtf.lk:2023 දිගුව ඔස්සේ දැක්වෙන වෙබ් බිහිදොර(web portal) සඳහා ඇතුලත් කළ යුතුව ඇත.

02. ඒ සඳහා, පළමුව පද්ධතියේ පරිශීලක ගිණුම් සාදා ගත යුතු අතර, ඒ පිළිබඳව උපදෙස් සඳහන් උපදෙස් පත්‍රිකාව http://app.mdtf.lk:2023/PDF/UserManual.pdf ඔස්සේ පරිශීලනය කර (දෘඩ පිටපත ඇමුණුම 1 මගින් දක්වා ඇත) අවශ්‍ය පරිශීලක ගිණුම් සකසා එම ගිණුම් හරහා ඔබ වෙත ලැබී ඇති අයදුම්පත් හැකි ඉක්මනින් පද්ධතිය වෙත ඇතුළත් කරන මෙන් කාරුණිකව සඳහන් කරමි.

03. මෙම පද්ධතිය පරිශීලනයේදී මතු වන ගැටළු, පද්ධතිය හරහාම විසඳා ගැනීමේ ක්‍රමවේදයක් පද්ධතිය තුල සකසා ඇති අතර, යම් විමසීමක් කිරීමට අවශ්‍ය වේ නම් 0773721173 දුරකථන අංකය සහ colomboceylon@gmail.com යන ඉ-තැපැල් ලිපිනය ඔස්සේ පහත නම් සඳහන් නිලධාරී මහතා සම්බන්ධ කර ගත හැක.

**ආචාර්ය ජනක මුදලිගේ, අධ්‍යක්ෂ(තොරතුරු තාක්ෂණ)** - (නම් කරන ලද), බහු කාර්ය සංවර්ධන කාර්ය බලකා දෙපාර්තමේන්තුව

04. තවද, මේ සම්බන්ධව ඔබ විසින් දක්වන සහයෝගය ඉතා අගය කොට සලකන අතර, මේ පිළිබඳව කඩිනමින් ඔබ යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් වරුන් දැනුවත් කරන මෙන් වැඩි දුරටත් කාරුණිකව දන්වා සිටිමි.

කේ.ජී .ධර්මතිලක
අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු )
රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

පිටපත : 01. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය - කරු. දැ.ගැ .ස.
02. ලේකම්, මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය - කරු. දැ.ගැ .ස.
03. නන්ද මල්ලවආරච්චි, විශ්‍රාමික මේජර් ජනරාල් (බහු කාර්ය සංවර්ධන කාර්ය බලකාය භාර නිලධාරී) - කරු. දැ.ගැ .ස.